## පෙර වදන

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක් ව පැවති, 1948 දි නිදහස ලැබූ ශ්‍රී ලංකාව 1977 වන තෙක්ම අනුගමනය කළේ බොහෝ දුරට ආරක්‍ෂණවාදි ආර්ථික ප්‍රතිපත්තියකි. රාජ්‍ය ව්‍යවසායකත්වය යටතේ සංවර්ධන කටයුතු මෙහෙය වීම මෙහි දි සිදු වූ අතර, අන්තර් ජාතික කටයුතුවල දි විදේශ විනිමය නීති රීති දැඩි ලෙස ක්‍රියාත්මක කිරීමට වග බලා ගන්නෝ ය. මෙ මගින් ආනයන කටයුතු සීමා වී දේශීය නිෂ්පාදන ධෛර්යමත් වනු ඇතැයි බලාපොරොත්තු විය. එහෙත් මෙම ක්‍රමය යටතේ දශක 03 ක කාලයක් මුළුල්ලේ ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකාවට ප්‍රමාණවත් ආර්ථික වර්ධන අනුපාතයක් පවත්වා ගැනීමට නො හැකි වීමෙන් සේවා වියුක්ති තත්ත්වය වඩාත් ප්‍රබල ලෙස බල පැවැත්විනි.

70 දශකය වන විට ලෝකයේ බොහෝ රටවල් මෙම ආරක්‍ෂණවාදි ආවෘත ආර්ථික ප්‍රතිපත්තියෙන් බැහැර ව වඩාත් විවෘත ක්‍රමයක් කරා නැඹුරු වීමක් දැකිය හැකි ය. ශ්‍රී ලංකාව ද 1977 වර්ෂයේ දි එතෙක් අනුගමනය කරමින් සිටි ආරක්‍ෂණවාදි ආර්ථික ප්‍රතිපත්තිය වෙනුවට අන්තර් ජාතික වශයෙන් සබඳතා වඩාත් පුළුල් වන විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් කෙරේ විශ්වාසය තැබීමට තීරණය කළා ය. එම ආර්ථික ප්‍රතිපත්තිය යටතේ ශ්‍රී ලංකාව අත් කරගත් ආර්ථික ප්‍රගතිත් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක යෙදීම මෙම නිබන්ධනය මගින් සිදු වේ. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන විවෘත ආර්ථිකයේ ස්වභාවයත්, එමගින් බිහි වූ ආර්ථික උපනතීත් යටතේ සේවා නියුක්තියෙහි ව්‍යුහමය ප්‍රවනතා කවරේද යන්නත් අධ්‍යයනයෙන් අව -ධානයට ගැනෙනු ඇත.

1977 -1990 අතර කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා ආර්ථිකයෙහි ප්‍රගතිත් පිළිබඳ අධ්‍යයනය කිරීම පහසුව තකා, ඒ ඒ විෂයයන් එකතුව ජාතික ආදායම නියෝජනය කෙරෙන ප්‍රාථමික, ද්විතියික හා තෘතික වශයෙන් අංශ 03 කට බෙදා විශ්ලේෂණය කෙරෙනු ඇත. උක්ත කාලය තුළ ආර්ථිකයෙහි ප්‍රගතිත් තුලනාත්මකව සලකා බැලීමේ බලාපොරොත්තුව මත, විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවූ 1948 - 1977 අතර කාලය තුළ දි ප්‍රාථමික, ද්විතියික, හා තෘතික අංශයන් ජාතික නිෂ්පාදිතයට දායක වූ ආකාරය වෙනම ම විමසා බැලීමට

නියමිත ය. මෙම යුගයන් දෙක තුළ දී ක්‍රියාත්මක වූ ප්‍රධාන සංවර්ධන යෝජනා ක්‍රම ද අධ්‍යයනය තුළින් විමසා බැලෙන අතර, ඒවා සේවා වියුක්ති ගැටළුව විසඳීම සඳහා කෙතරම් දුරට දායක වී ඇත්ද යන්න නිගමනය කිරීම අවසානයේ දී සිදු වනු ඇත.

සමස්තයක් ලෙස ගත් කළ ශ්‍රී ලංකාව නිදහස ලැබූ අවධියේ සිට 1990 වර්ෂය දක්වා කාලය තුළ සංවර්ධන කටයුතුවල නියුක්ත වූ ආකාරයත්, විශේෂයෙන් ම 1977 න් පසුව අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්තිය හා සේවා නියුක්තිය අතර සබඳතාව පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමටත් මෙම පර්යේෂණ නිබන්ධය මහෝපකාරී වනු ඇතැයි විශ්වාස කරමි.

පශ්චාත් උපාධි අධ්‍යයනයක දී ශිෂ්‍යයෙකුට මුහුණ දීමට සිදු වන විෂය බද්ධ සහ පර්යේෂණ ගැටළු සියල්ල මනාව තේරුම් ගෙන, ඒවා එකින් එක ඉතා සරල ආකාරයෙන් විසඳා ගනිමින් මෙම පර්යේෂණය සාර්ථක අන්දමින් කර ගැනීමට අවශ්‍ය වූ කාලෝචිත උපදෙස් හා ධෛර්ය ලබා දෙමින් මා දිරි ගැන්වූ රුහුණු විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකා -චාර්ය පි.එම්.දයානන්ද මහතාට ස්තූති කිරීමට මෙය අවස්ථාව කර ගනිමි. මෙම පර්යේෂණය සම්බන්ධ ගැටළු නිර්ණය කර ගැනීම සඳහා දරණ ලද හැම ප්‍රයත්නයකදී ම එතුමා තමන් වෙත භාරවූ කාර්ය යටතේ පවා කාලය හා ශ්‍රමය කැප කරමින් මා වෙත දෙනු ලැබූ සහයෝගයත්, අමිල මඟ පෙන්වීමත් නො වන්නට පර්යේෂණය මේ ආකාරයෙන් නිම කරන්නට නො හැකි වන බව නිහතමානීව සඳහන් කළ යුතු ය.

අවශ්‍ය අවස්ථාවන්හි දී මඟහු උපදෙස් ලබා දෙමින් හා නිසි අයුරින් මා මෙහෙයවමින් උපදේශනයෙහි යෙදුනු ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ හිටපු අංශාධිපති හා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ වර්තමාන පීඨාධිපති මහාචාර්ය ඩී.අතපත්තු මහතාගෙන් ලැබුණු සහයෝගය මෙහිදී ගෞරවයෙන් සිහිපත් කරනු කැමැත්තෙමි.

අධ්‍යයනය තව දුරටත් පෝෂණය කර ගැනීම සඳහාත් එහි කාර්යය කටයුතු මනාව හසුරුවා ගැනීම සඳහාත්, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ අංශාධිපති පියසිරි විතානගේ මහතා විසින් ලබා දෙනු ලැබූ සහයෝගය ප්‍රීති පූර්වකව ඇගයීම සඳහා මෙය අවස්ථාව කර ගනිමි.

එමෙන්ම අධ්‍යයනයේ සාර්ථකත්වය පතා සැබෑ සහෝදරත්වයෙන් ම සහයෝගය දැක්වූ, සමාජ සේවා මධ්‍ය මණ්ඩලයේ දිපාල් ප්‍රසන්න ද සිල්වා සොයුරා ද සතුටින් සිහිපත් කරනු කැමැත්තෙමි.

තෙ වසරක් මුලුල්ලේ මා හා එක්ව යමින් මගේ අධ්‍යාපන කටයුතු සඳහා අමිල සහයෝගයක් ලබා දුන් මගේ දයාබර බිරිඳ කුමාරි මෙහිදී ආදරයෙන් සිහිපත් කරනු කැමැත්තෙමි.